# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2196/50 - 2020 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2020.10.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ
3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 උප වගන්තියෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2020.09.10 දින පැවති මහා සභාවේ තීරණ අංක 05.02 යටතේ පහත සඳහන් යෝජනාව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට යෝජනා සම්මත වී ඇති බව මෙයින් නිවේදනය කරමි.

**ආර්. එම්. ඩී. පී. ඩබ්. එම්. එස්. බී. යටවර,**
සභාපති,
මහනුවර කඩවත් සතර සහ ගඟවට.
කෝරළේ ප්‍රාදේශීය සභාව.

2020 ක්වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළකරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් ස්ථිර කොට 2017.05.05 දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත්කරන ලද්දා වූ පහත සඳහන් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථා :

01. ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව

02. ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

03. බදු අයකර ගැනීමේ කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබා ගැනීමේ අතුරු ව්‍යවස්ථාව

04. ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

05. පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව

06. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

07. සත්ත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

08. කුළී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

09. පෞද්ගලික ඉගැනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

10. ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම යෝජනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කිරීමටත්, ඊට පෙර දින මධ්‍යම රාත්‍රී 12 සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුන අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වූ අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් ඉහත කී පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**ආර්. එම්. පී. ඩබ්. එම්. එස්. බී. යටවර,**
සභාපති,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව.

10-900

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.